# 7 මහා ගල එසවූ අන්දරේ

අන්දරේ විහිළු තහළුවලට දක්ෂ කෙනෙකි. අන්දරේගෙ ගමේ හිටියා ගමරාල කෙනෙක්. ගමරාල තරමක් අහංකාරයි. ගමරාලගෙ කුඹුරේ මැද මහා ගලක් තිබුණා. මේ ගල ගොවිතැන් කටයුතුවලට හිරිහැරයක්.



මේ ගල අයින් කරන්න ගමරාලට ඕනෑ වුණා. ගමරාල හැම වෙලාවෙ ම ඒ ගැන කල්පනා කළා. ගමේ කිහිපදෙනකුගෙන් උදව් ඉල්ලුවා. ගමරාලගෙ අහංකාරකම නිසා කවුරුත් උදව්වට ආවෙ නෑ. පස්සේ අලියෙක් දාලා ගල පෙරළන්න බැලුවා. අනේ! ඒත් හරි ගියේ නැහැ.



අන්තිමේ දී ගමරාල ගමේ ආරංචියක් පතුරවලා යැව්වා. "කුඹුරේ තියෙන මහා ගල අයින් කරන්න ඕන. ඒක කරන්න පුළුවන් කෙනෙක් එන්න. එයාට වටිනා තෑගි බෝග දෙනවා කියලා."

මේ ආරංචිය අන්දරේටත් දැනගන්න ලැබුණා. අන්දරේ ගියා ගමරාල මුණගැහෙන්න. "ගමරාලට හොඳ විහිළුවක් කරන්න ඕනෙ, ගමරාලගේ ආඩම්බරකම අඩු කරන්න ඕනෙ." අන්දරේ හිතුවා.



"මුන්නැහෙගේ කුඹුරෙ මහ ගලක් තියෙනවා නෙ. ඒක අයින් කරලා දුන්නොත් තෑගි බෝග දෙනවලු නේ ද?" අන්දරේ ගමරාලගෙන් ඇහුවා.

මේක අහලා ගමරාල කිව්වා, "ඔව්! ඔව්! ගල පෙරළලා දෙන කෙනෙකුට මම වී බුසල් සීයකුයි, ඉඩම් අක්කරයකුයි දෙනවා."

එතකොට අන්දරේ කිව්වා, "මට වැඩේ පවරන්න. ඒත් මට එච්චර තෑගි ඕනේ නැහැ කියලා."

"අන්දරේට ඕනෙ මොනවා ද? ගමරාල අන්දරේගෙන් ඇහුවා. "මට මාසයක් කන්න දෙන්න. ඒ හොඳට ම ඇති" අන්දරේ කිව්වා. දැන් ගමරාලට හරි සතුටුයි. "මොනවා ද අන්දරේට කන්න බොන්න ඕනෙ?" ඒ පාර ගමරාල අන්දරේගෙන් ඇහුවා. "හීනටි හාලේ බතුයි, කළුකුං මසුයි, දවසකට එච්චර ලැබුණ ම හොඳට ම ඇති." අන්දරේ කිව්වා.

ඉතින් ...... අන්දරේගෙ ගෙදරට ම කෑම බීම යවන්න ගමරාල පොරොන්දු වුණා. එදා ඉඳලා හැමදා ම කෑම යවනවා.



ගමරාල හීනටි හාලේ බතුයි, කළුකුං මසුයි, අන්දරේගේ ගෙදරට ම යවනවා. අන්දරේ වැඩ කරන එක අමතක කරලා බිරිඳයි, පුතයි එක්ක කෑමවලින් හොඳ හැටි සප්පායම් වෙනව.

ඔය විධියට මාසයක් ම ගත වුණා. මාසෙකට පස්සේ අන්දරේ ගමරාලගේ ගෙදරට ගියා. ගමේ අයටත් මේක ආරංචි වුණා. එයාලත් අන්දරේ ගල පෙරළන හැටි බලන්න ආවා.

අන්දරේ වීරයෙක් වගේ ගල තිබුණු තැනට ගියා. "මේ ගල කොහේට ද දාන්න ඕනෙ?" ගමරාලගෙන් ඇහුවා. "වෙල පහළට දාන්න." ලොකු සතුටකින් ගමරාල කිව්වා.

එතකොට අන්දරේ ලොකු කොළපතක් කරේ තියා ගත්තා. ඊට පස්සේ නැමිලා "හා . . . . දන් හැමෝ ම මේ ගල උස්සලා මගේ කරේ තියන්න." අන්දරේ හයියෙන්

කිව්වා. එතන හිටපු මිනිස්සු පුදුම වුණා. එයාලා මුහුණට මුහුණ බලා ගත්තා.



ඒ පාර අන්දරේ කෙළින් වෙලා මෙහෙම කිව්වා. "ඇයි, පුදුම වෙලා බලාගෙන ඉන්නෙ. මෙයාලට උස්සලා තියන්න බැරි ද? එහෙම නම් මම කොහොම ද ගල ගෙනිහින් දාන්නෙ?"

ගමරාලට තේරුණා අන්දරේ එයාට විහිළුවක් කළා කියල. "ගල උස්සන්න පුළුවන් අය එකතු කරලා මට පණිවිඩේ එවන්න" කියලා අන්දරේ යන්න ගියා. ගමරාලගේ ආඩම්බරකම නිසා වෙච්ච ඇබැද්දිය ගැන මිනිසුන්ට කණගාටුයි. ඒ වුණාට "ගමරාලගෙ ආඩම්බරකමට මේක යස පාඩමක්" මිනිස්සු හිතුවා.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම 1

(i) පාඩම නිශ්ශබ්ද ව කියවන්න.

(ii) මේ පාඩමේ ඔබ වඩාත් සිත්ගත් අවස්ථා පන්තියට කියන්න.

(iii) ගමරාල සහ අන්දරේ අතර ඇති වූ සංවාදය ලියන්න.

(iv) අන්දරේ ගල අයින් කරන්න ඉල්ලූ දේවල් ගැන ඔබට සිතෙන්නේ කුමක් ද?

(v) මෙවැනි වෙනත් කතාවක් රසවත් ව පන්තියට ඉදිරිපත් කරන්න.

(vi) ඔබ සිනා ගැන්වූ රසවත් වාක්‍ය සොයා ලියන්න.

## ක්‍රියාකාරකම 2

(i) අලියෙක් **දාලා** ගල පෙරළන්න බැලුවා.

(ii) හොඳ විහිළුවක් කරන්නම් **කියලා** හිතුවා.

(iii) තාත්තා රැකියාව **කරලා** ගෙදර ආවා.

(iv) යාළුවාට තෑගි **දීලා** මම සතුටු වුණා.

මෙහි තද කළු අකුරින් දක්වා ඇති පද කියවා අවබෝධ කරගන්න. මේ වාක්‍යවල අදහස් එකකට වඩා ඇත. උදාහරණ ලෙස I , IV වාක්‍ය බලන්න. ඒවා සෑදී ඇත්තේ වාක්‍ය දෙකක් එකතු වීමෙනි.

i අලියෙක් දැම්මා. ගල පෙරළන්න බැලුවා.

iv යාළුවාට තෑගි දුන්නා. සතුටු වුණා.

පාඩම කියවා මෙවැනි පද රටා ඇති වැකි තෝරා ලියන්න.

## ක්‍රියාකාරකම 3

පහත සඳහන් එක් එක් වැකියේ හිස්තැනට යෙදිය යුතු පදය වරහන තුළින් තෝරා ලියන්න.

(i) මම පොත ................................ කෑම කෑවා.

(ii) නංගී අම්මාට ................................ පාසල් ගියා.

(iii) තාත්තා කෑම ...................................... මිදුලට ගියා.

(iv) මල්ලී තරගෙට ................................ තෑගි දිනුවා.

(v) උදෙන් ම................................ ආච්චි පන්සල් ගියා.

(නාලා, පීනලා, කියවලා, වැඳලා, කාලා )

## ක්‍රියාකාරකම 4

රවුම් කර ඇති වචන කෙරෙහි අවධානය යොමු කරමින් පහත ඡේදය කියවන්න.

මම අම්මාට තාත්තාට වැඳලා මිදුලට බැස්සා. වාහනය ඇවිල්ලා නතර කළා. මම ඒකෙ නැගලා පාසලට ගියා. ඉක්මනට පන්තියට ගිහිල්ලා වාඩි වුණා. එතකොට යාළුවෙක් ඇවිල්ලා කතා කළා. පොත කියවලා ආවාද කියලා ඇහුවා. අපි දෙන්න ම නැගිටලා එළියට ආවා. දෙන්න එක්ක පුස්තකාලයට ගිහිල්ලා පොත හෙව්වා. පොත හොයලා කියවලා පන්තියට ආවා.

## ක්‍රියාකාරකම 5

ගමරාල **හැම වෙලාවෙ ම** කල්පනා කළා.

ගමරාල **නිතර ම** කල්පනා කළා.

ගමරාල **හැම තිස්සෙ ම** කල්පනා කළා.

හැම වෙලාවෙ ම, නිතර ම, හැම තිස්සෙ ම යන පදවල තේරුම සමාන ය.

☆ පහත සඳහන් වැකිවල රවුම් කොට ඇති වචනවලට සමාන තේරුම ඇති පද සොයා ලියන්න.

(i) එයාට ලොකු කරදරයක් තිබුණා.

(ii) ඒ තමයි කුඹුරේ මැද තියෙන මහා ගල.

(iii) ගමේ කිහිප දෙනකුගෙන් උදව් ඉල්ලුවා.

(iv) එයාට වටිනා තෑගි බෝග දෙනවා.

(v) අන්දරේ ගියා ගමරාල මුණගැහෙන්න.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම 6

පහත දක්වෙන වැකිවල ඉරි ඇඳි පදයට හෝ පදවලට සමාන පද වරහනින් තෝරා නැවත ලියන්න.

උදාහරණය :- ළමයා **පාසලට** යනවා.
ළමයා **විදුහලට** යනවා.

(i) අපි **නැවෙන්** පිටරටකට ගියා.

(ii) මම **රෝගයට බෙහෙත්** ගත්තා.

(iii) ළමයි **වනයේ** ඇවිදින්නට යනවා.

(iv) ක්‍රීඩකයා තරගය **නිමා** කළා.

(v) ඔවුන් **විවිධ පාට** මල් කඩනවා.

(vi) **කාන්තාව දිය** ගෙන ඒමට යනවා.

(vii) මගේ **ඇසට** දූවිලි ගියා.

(viii) **යාළුවාට ලස්සන ගෙයක්** තියෙනවා.

(ix) **චන්ද්‍රයා** පෝය දාට පායනවා.

(x) සම්පත් **අකුරු** පැහැදිලි ව ලියනවා.

(අවසන්, වතුර, නෙතට, නෞකාවෙන්, වර්ණ, වනිතාව, අලංකාර, ඖෂධ, කැලෑවේ, අසනීපයට, නොයෙක්, නිවසක්, හඳ, අක්ෂර, මිතුරාට )

## ක්‍රියාකාරකම 7

ගැළපෙන පද යොදා සම්පූර්ණ කරන්න.




### හරහට

1 අහස යන්නට සමාන පදයකි.

3 ඇස යන්නට සමාන පදයකි.

5 සිත හැඳින්වීමට යෙදෙන තවත් පදයකි.

7 සමූහය යන අර්ථය දේ.

9 නෙළුම් මල යන්නට සමාන පදයකි.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

**පහළට**

2 මැණික් යන්නට සමාන පදයකි.

4 නාමය යන අරුත දෙයි.

6 සාගරය යන්නට සමාන පදයකි.

8 අවංක නැති යන අර්ථය දේ.

10 වැල යන්නට සමාන පදයකි.